# සන්නිවේදන අධ්‍යයන ප්‍රවේශය

## 01 පාඩම

...න්නිවේදනය යනු අදහස් හා තොරතුරු හුවමාරු වන ක්‍රියාවලියකි.

| සන්නිවේදනය - සං + නි + වේදනය | |
|---|---|
| සං | - මනා වූ |
| නි | - ඒකාබද්ධ වූ / කැටි වූ |
| වේදනය | - දැනවීම හෝ හැඟවීම |

... යමක් මැනවින් කැටිකොට යමෙකු තුළ දැනවීම සන්නිවේදනයයි.




## සන්නිවේදනයේ ඓතිහාසික විකාශනය

මානව සන්. පියවර 4 කින්

**1 වන යුගය**

- සංඥා සංකේත ඉඟි, අභිනය.
- දුර අවකාශය ජයගැනීමට නොහැකි වීම.

**2 වන යුගය**

- ගින්දර, දුම, බෙර වර්ණ යොදා ගැනීම
- දුර අවකාශය ජයගැනීම.
- නිශ්චිතාර්ථ ඇති වීම.

**3 වන යුගය**

- භාෂාව නිර්මාණය කරගැනීම.
- මුලින්ම භාෂණය හා පසුව ලේඛණය.
- සංකීර්ණ හා නිශ්චිත අදහස් ප්‍රකාශනය.

**4 වන යුගය**

- ...නමාධ්‍ය ... වීම.
- ...න්නිවේදනය ...ක්ෂණික උපක...ණ හා ...ද්ධ වීම.
- නව මාධ්‍ය දක්වා ...ර්ධනය වීම.

| | |
|---|---|
| 1 | ස්වාභාවික මාධ්‍ය |
| 2 | ප්‍රාථමික මාධ්‍ය |
| 3 | සම්ප්‍රදායික මාධ්‍ය |
| 4 | ජන මාධ්‍ය |
| 5 | නව මාධ්‍ය |

www.atsapi.lk

Scanned by CamScanner

## ❖ සන්නිවේදන නිර්වචන ඇසුරෙන් සන්නිවේදනය හඳුනා ගනිමු.

**හැරල්ඩ් ඩ්වයිට් ලැස්වෙල්ගේ නිර්වචනය** (01)

"යම් කිසිවෙක්, යම් කිසිවක්, කිසියම් නාලියකින් යම් කිසිවෙකුට, කිසියම් බලපෑමක් සඳහා කියනු ලබන දෙය සන්නිවේදනයයි."

- දෘෂ්ටිකෝණය - දේශපාලන විද්‍යාත්මක දෘෂ්ටිකෝණය
- අවධාරිත කරුණ - බලපෑම.

**මහාචාර්ය විල්බර් ශ්‍රාම්ගේ නිර්වචනය** (02)

"තොරතුරු ගැබ් වූ , සංඥාවක් හේතු කොටගෙන දෙපාර්ශවයක් අතර එක හා සමාන මනෝභාවයන් ඇතිකරලීම සන්නිවේදනයයි."

- දෘෂ්ටිකෝණය - මනෝ විද්‍යාත්මක දෘෂ්ටිකෝණය.
- අවධාරිත කරුණු -
  - ◆ සන්නිවේදනය මානසික ගණුදෙනුවක් බව.
  - ◆ අන්තර්පුද්ගල සන්නිවේදනය ඇසුරෙන් විග්‍රහ කිරීම.

**එඩ්වඩ් සැපිර්ගේ නිර්වචනය** (03)

"සමාජය, සන්නිවේදනය හේතු කොටගෙන සන්නිවේදනය තුළින් පවත්වාගෙන යන සබඳතා ජාලයකි. චර්යාවට අදාළ සෑම සංස්කෘතික රටාවක්ම හා සමාජ චර්යාවට අදාළ සෑම ක්‍රියාවක්ම කෙලින්ම හෝ වක්‍ර ආකාරයෙන් සන්නිවේදනයට සම්බන්ධතාවයක් ඇත."

- දෘෂ්ටිකෝණය - සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණය.
- අවධාරිත කරුණු -
  - ◆ සන්නිවේදනයේ ප්‍රබල සමාජ අවශ්‍යතාවක් පවතින බව
  - ◆ සන්නිවේදනයේ ප්‍රබල සමාජීය බලපෑම.

www.artsapi.lk

Scanned by CamScanner

අසම සම
උසම තැන

2011 A/L 01 (i)

## ෂැනොන් හා වීවර්ගේ නිර්වචනය

04 සන්නිවේදනය යනු යම් තැනක නිර්මාණය වූ හෝ තෝරාගත් පණිවිඩයක් ඒ ආකාරයෙන්ම හෝ සමාන ලෙස වෙනත් තැනකදී ප්‍රතිනිර්මාණය කිරීමයි.

- දෘෂ්ටිකෝණය - තාක්ෂණික / යාන්ත්‍රික / කාර්මික.
- අවධාරිත කරුණ -
  - සන්නිවේදනයේ තාක්ෂණික සම්බන්ධතාවය.
  - සංදේශ විකෘති නොකළ යුතුබව.

## සන්නිවේදන මූලිකාංග

2015 A/L 01 (i)

**01 තොරතුරු මූලාශ්‍ර**
සන්නිවේදන ක්‍රියාවලියේ ආරම්භය ලෙස සංදේශයට අවශ්‍ය තොරතුරු ලබාදෙයි. යම් පුද්ගලයෙක්, ස්ථානයක් හෝ දෙයක් විය හැකිය.

**02 සන්නිවේදකයා/ ආකේතිකරය**
සන්නිවේදකයා තොරතුරු මූලාශ්‍රයෙන් තොරතුරු ලබාගෙන ඒ ඇසුරෙන් සංදේශ සකසා ග්‍රාහකයා වෙත ඉදිරිපත් කරයි.

**03 පණිවිඩය/සංදේශය**
ග්‍රාහක ගත කරනු අංගය

**04 මාධ්‍ය**
නාලිකාව

**05 ග්‍රාහකයා/විකේතිකරය**
සන්නිවේදන ක්‍රියාවලිය තුළ පණිවිඩය ලබා ගන්නා තැනැත්තාය. ඔහු සංදේශය තෝරාගෙන, සංවිධානය කර, තේරුම් ගැනීම සිදු කරයි.

**06 ප්‍රතිචාර**
ග්‍රාහකයා සන්දේශය ලබා ගෙන පෙරළා සන්නිවේදකයා වෙත යොමුකරන ප්‍රතික්‍රියා විශේෂයෙකි. ධනාත්මක ප්‍රතිචාර/ ඍණාත්මක ප්‍රතිචාර

**07 ප්‍රතිපෝෂණය**
පණිවිඩය ලබාගන්නා ග්‍රාහකයා තම තොරතුරු දැනුම හා අත්දැකීම් තුළින් සන්නිවේදකයා පෝෂණය කිරීම මේ නම් වේ.

**08 බලපෑම**
සන්නිවේදකයා යම් සංදේශයක් හරහා ග්‍රාහකයා තුළ සිදුකරන වෙනස බලපෑම වේ. බලපෑම යහපත් බලපෑම හා අයහපත් බලපෑම ලෙස වේ.

**09 අත්දැකීම් පසුතලය**
සන්නිවේදකයා හා ග්‍රාහකයා යන දෙදෙනාටම පොදු අත්දැකීම් වැඩි වශයෙන් පැවතිය යුතුය.

**10 සන්දර්භය**
කිසියම් සංදේශයක අන්තර්ගත විවිධ සාධක සන්දර්භයයි.


මූලිකාංග

www.artsapi.lk

Scanned by CamScanner

## සන්නිවේදන සංකල්ප

❖ ලෝකයේ එක් එක් කාලවල පාලකයින් ක්‍රියාත්මක කරන ලද සන්නිවේදන ක්‍ර සන්නිවේදන සංකල්ප වේ.




www.artsapi.lk

### 1 අධිපතිවාදී සන්නිවේදන සංකල්පය

සමාජවල නායකයින්,පාලකයින්,විවිධ උපක්‍රම මගින් සන්නිවේදන කටයුතු හා මාධ්‍ය ක්‍රියාකාරිත්වය පාලනය කළ ක්‍රමයකි.

❖ පැරණිම සංකල්පය ලෙස රාජාණ්ඩු පාලන ක්‍රම තුළ ඒකාධිපති පාලක ක්‍රි.ව. 14,15,16 සියවස්වල ක්‍රියාත්මක කර තිබේ.


මෙම සංකල්පය ක්‍රියාත්මක කළ පාලකයින්

1. එංගලන්තය - VIII වන හෙන්රි රජු
2. ස්පාඤ්ඤය - ෆ්‍රැන්කෝ රජු
3. ප්‍රංශය - ලුවී රජවරු/චාල්ස් ඩිගෝල්
4. ජර්මනිය - අඩොල්ෆ් හිට්ලර්

Scanned by CamScanner

වර්තමාන ජනමාධ්‍ය ක්‍රියාවලිය තුළ චාරණය ක්‍රියාත්මක වන ඒවි 4 උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න

1. පාලනය කිරීම / තහනම් කිරීම
2. දඬුවම් කිරීම
3. නිසි බලධරයෙක් පත්කිරීම
4. බලපත්‍ර නිකුත් කිරීම




## මෙම සංකල්පයේ ලක්ෂණ

- සීමිත පිරිසක් අසීමිත බලයක් යොදා ජනමාධ්‍ය පාලනය කිරීම.
- ජනතාවගේ අයිතිවාසිකම් හා නිදහස අහිමි වීම.
- ජනමාධ්‍ය ප්‍රජා පීඩිත උපකරණයක් බවට පත්වීම.
- පාලකයා පිළිබඳ අසීමිත ප්‍රචාරයක් මාධ්‍ය හරහා සිදුවීම.

②

# නිදහස් මතවාදී සංකල්පය

කිසිඳු පාලනයකින් තොරව ජනමාධ්‍ය ප්‍රමුඛ සන්නිවේදන කටයුතුවලට නිදහසේ හැසිරෙන්නට ඉඩ ලබා දුන් ක්‍රමයයි.

❖ අධිපතිවාදී පාලනයට එරෙහි උද්ඝෝෂණවල, අරගලවල ප්‍රතිඵලයක් ලෙස උදා වු නිදහස් පාලන ක්‍රමයට සමගාමිව 17 වන සියවසේදී මෙය බිහි විය.

## මෙම සංකල්පයේ ලක්ෂණ

- මාධ්‍ය සංදේශ පළකරන්නන් ඒ සම්බන්ධයෙන් වගකීම බාර නොගැනීම.
- ඕනෑම අයෙකුට මාධ්‍ය ආයතන පවත්වා ගැනීමට හැකිවීම.
- මාධ්‍ය හිමි ව්‍යාපාරිකයින් ලාභය අරමුණු කරගෙන මාධ්‍ය හැසිරවීම.
- රජය මාධ්‍යට බලපෑම් සිදු නොකර වෙනත් පොදු සමාජ කටයුතු ඉටුකළ යුතු බව අවධාරණය කිරීම.
- මාධ්‍ය ප්‍රවේශමෙන් පරිහරණය කළ යුතු බව අවධාරණය කිරීම.

> මෙම සංකල්පයේදි ව්‍යාපාරිකයින් ලාභ සෙවීම සඳහා මාධ්‍ය නිදහස අයුතු ලෙස භාවිත කරන ලදී. කහ පුවත්පත් කලාව වැනි අහිතකර මාධ්‍ය ප්‍රවණතා බිහි විය.

Malee Fonseka

www.artsabi.lk

Scanned by CamScanner

A/L - 2016

③ (සෝවියට් කොමියුනිස්ට් සන් - වාදය)

## සෝවියට් සමාජවාදි සන්නිවේදන සංකල්පය

- රජය මෙන්ම මාධ්‍ය ද එක්ව පොදු සමාජ සුබසාධනය උදෙසා එනම් රජය සමාජයේ පොදු යහපත උදෙසා මාධ්‍ය පාලනය කළ ක්‍රමයයි.
- V.I ලෙනින් 1917 ඔක්තෝම්බර් විප්ලවයෙන් පසු රුසියාව තුළ මෙම සංකල්පය හඳුන්වා දී තිබේ.
- චීනය / කියුබාව / වියට් නාමය වැනි රටවලට ද ව්‍යාප්ත විය.

### මෙම සංකල්පයේ ලක්ෂණ

- පුවත්පත සමාජවාදී දේශපාලන රාමුව තුළ පමණක් කටයුතු කිරීම.
- මාධ්‍යකරුවන් කොමියුනිස්ට් පක්ෂ සාමාජිකයින් විය යුතු අතර රජයේ සේවකයින්ද විය යුතුය.
- රජය පුවත්පතේ ආර්ථිකය පාලනය කිරීම.
- පුවත්පත කම්කරු පන්තිය කෙරෙහි වැඩි ඉඩකඩ ලබාදීම.
- පුවත්පත සෑමවිටම රජයේ ප්‍රතිපත්ති පමණක් ඉටු කිරීම.

> "මෙම සංකල්පය සමාජවාදයේ අභාවයට යාමත් සමඟ අභාවයට ගොස් තිබේ."

④

## සමාජ වගකීම පිළිබඳ සන්නිවේදන සංකල්පය

මාධ්‍ය මෙන්ම රජය හැමවිටම සමාජයට වගකියමින් මාධ්‍ය හැසිරවිය යුතු බව මෙම සංකල්පය අවධාරණය කරයි.

- මාධ්‍ය වෙත ලැබෙන නිදහස අයුතු ලෙස භාවිත කරන විට රජය මාධ්‍ය පාලනයට ඉදිරිපත් වෙයි.
- ක්‍රි.ව. 1947 දී ඇමරිකාවේ හචින්ස් කොමිසම මෙය නිර්දේශ කොට තිබේ.

www.artsapi.lk

Scanned by CamScanner

### මෙම සංකල්පයේ ලක්ෂණ

- මාධ්‍ය තුළ පල කරන සංදේශ සම්බන්ධයෙන් ඒවා පළකරන්නන් වගකීමට බැඳීම.
- දිනයේ සිදුවීම් එක්රැස් කොට සත්‍ය හා බුද්ධිමත් වාර්තාවක් මාධ්‍ය තුළින් ඉදිරිපත් කළ යුතු බව.
- රජය හා මාධ්‍ය එක්ව සමාජයට වගකියමින් මාධ්‍ය හැසිරවිය යුතු බව.
- මාධ්‍ය තුළ සෑම මතවාදයකටම සම නියෝජනයක් ලබා දෙමින් සෑම ජන කණ්ඩායමකටම සමාන අවස්ථා සලසා දීම.

> "බොහෝ සාර්ථක ලක්ෂණ සහිතව ක්‍රියාත්මක වුණි."

5

## සංවර්ධන සන්නිවේදන සංකල්පය

> ජාතික සංවර්ධනය අරමුණු කරගෙන ජනමාධ්‍ය හා රජය එක්ව මාධ්‍ය හැසිරවිය යුතු බව දක්වයි.

❖ යුනෙස්කෝ සංවිධානය 1950 දශකයේ දී තුන්වන ලෝකයේ රටවල සුබ සිද්ධිය වෙනුවෙන් හඳුන්වා දී තිබේ.

### මෙම සංකල්පයේ ලක්ෂණ

- ජනමාධ්‍ය ආයතනවල න්‍යාය පත්‍රය විය යුත්තේ ජාතික සංවර්ධනය බව.
- ජනමාධ්‍ය රජය සමඟ එක්ව සංවර්ධන වැඩසටහන් වලට අනුග්‍රහය ලබා දිය යුතු බව.
- සංවර්ධන සංදේශ බහුලව මාධ්‍ය ආයතන හරහා ප්‍රචාරය කිරීම.

> "දේශපාලඥයින් සංවර්ධනයට මුවා වී මාධ්‍ය හරහා වාසි ලබා ගැනීම. හේතුවෙන් මෙමසංකල්පය ඇතැම් රටවල අසාර්ථකයි."

www.artsapi.lk

Scanned by CamScanner

# ප්‍රජාතන්ත්‍රීකරණ සන්නිවේදන සංකල්පය

රටක ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ සන්නිවේදන කටයුතු හා මාධ්‍ය හැසිරවීමේ ක්‍රමයයි.

❖ රටේ පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, සෙසු නීතිරීති හා ජනමාධ්‍ය නීති පද්ධතිය ඔස්සේ මහජන නියෝජිතයින් මාධ්‍ය පාලනය කරයි.

2013 A/L 06 (ii)

**සන්නිවේදනයේ කාර්යයන්**

- 01 තොරතුරු සම්පාදනය
- 02 අධ්‍යාපනය
- 03 විනෝදාස්වාද සම්පාදනය/ විශ්‍රාන්තිය
- 04 පෙළඹවීම
- 05 සමාජානුයෝජනය
- 06 සංස්කෘතික ප්‍රගමනය
- 07 සමාජ ඒකාබද්ධතාව
- 08 සමාජ උරුමය නව පරපුරට පැවරීම
- 09 පරිසරය පිළිබඳ සුපරීක්ෂණ
- 10 සංවාද හා සාකච්ඡා කාර්යය

**තොරතුරු සම්පාදනය**

- පුද්ගලයාට පෞද්ගලිකවද, සමාජයට පොදුවේද අවශ්‍ය තොරතුරු ජනමාධ්‍ය ප්‍රමුඛ සන්නිවේදනය තුළින් සමාජයට ලබාදෙයි.
- දැඩි වගකීමෙන් කළ යුතු අත්‍යවශ්‍ය කාර්යයකි.

**අධ්‍යාපනය ලබාදීම**

- විධිමත්ව හා අවිධිමත්ව ජනමාධ්‍ය ප්‍රමුඛ සන්නිවේදනය තුළින් අධ්‍යාපනය ලබාදෙයි.
- ජපානයේ NHK රූපවාහිනී සේවය සුවිශේෂී අධ්‍යාපනික කාර්යභාරයන් ඉටු කරයි.

www.artsapi.lk



Scanned by CamScanner

තොරතුරු සම්පාදන කාර්යයෙහි වැදගත්කම පිළිබඳ කරුණු 4ක් 2010 A/L

විවිධ වැදගත් දේ සම්බන්ධයෙන් දැනුම, අවබෝධය ලබා දීම.

නිරන්තරයෙන් පරිසරය පිළිබඳ ව අවදියෙන් සිටීමට හැකි වීම.

විවිධ මතවාදයන් ගොඩ නැගීම

විවිධ ආගම් හා විශ්වාස පිළිබඳව පූර්ව දැනුම් දීම.

---

2014 A/L සන්නිවේදනයේ මූලික අරමුණු 4ක්

1. තොරතුරු සම්පාදනය 2 අධ්‍යාපනය

3. පෙළඹවීම 4 විනෝදාස්වාදය.

---

www.artsapi.lk

Scanned by CamScanner

**පෙළඹවීම් කාර්යය**

- සන්නිවේදනය මගින් කිසියම් පුද්ගලයෙකු යම් කිසිවක් සඳහා යොමු කරවීමයි.
- යහපත් පෙළඹවීම් මෙන්ම අයහපත් පෙළඹවීම් පවතී.
- වර්තමාන ජනමාධ්‍ය නාලිකා තුළ වාණිජමය පෙළඹවීම්ද බහුලව තිබේ.

**විනෝදාස්වාද සම්පාදනය**

- ජනමාධ්‍ය සරල විනෝදය මෙන්ම උසස් විනෝදය හෙවත් ප්‍රඥා උත්පාදක විනෝදය (විශ්‍රාන්තිය) ලබාදෙයි.
- සරල විනෝදය කෙරෙහි සන්නිවේදක මෙන්ම ග්‍රාහක ඇල්ම වැඩි වී තිබේ.

**පරිසරය පිළිබඳ සුපරීක්ෂණය**

- පරිසරය පිළිබඳ දැඩි විමසිල්ලෙන් සිට අනතුරු, උවදුරු ආදිය ජනතාවට දැනුම් දී ව්‍යවසනයන්ගෙන් සමාජය ආරක්ෂා කර ගැනීමයි.
- මුර බල්ලාගේ භූමිකාව ඉටු කිරීම ලෙස ද මෙය හැඳින්වේ.

**සමාජ උරුමය නව පරපුරට පැවරීමේ කාර්යය.**

- අතීත මිනිසා දායාද කළ මහා විශාල උරුමය හා ඥාණ සම්භාරය සන්නිවේදනය විසින් අනාගත පරපුරට ලබා දීම.

**සංවාද හා සාකච්ඡා කාර්යය**

- වර්තනා අදහස් හා සැඟවුණු අදහස් මතුකර ගැනීමට සංවාද හා සාකච්ඡා කාර්යය වැදගත් වෙයි.

**සමාජානුයෝජන කාර්යය**

- සමාජානුයෝජනය යනු තමා ජීවත් වන සමාජය අපේක්ෂා කරන ආකාරයට සමාජයේ ජීවත් වන විවිධ අවස්ථාවල හැසිරිය යුතු ආකාරය ඉගෙන ගැනීමයි.
- දැඩි වගකීමෙන් ඉෂ්ඨ කළ යුතුය.

**සමාජ ඒකාබද්ධතා කාර්යය**

- ආගම, ජනවර්ගය ආදී ලෙස බෙදී වෙන්ව පවතින සමාජය ඒකාබද්ධ කිරීමේ කාර්යයි.

**සංස්කෘතික ප්‍රගමන කාර්යය**

- වර්තනා සංස්කෘතිකාංග ආරක්ෂාකර, නව පරම්පරාවට ඒවා හඳුන්වා දෙමින් සංස්කෘතියේ ඉදිරි දියුණුවට කටයුතු කළ යුතුය.

www.artsapi.lk

Scanned by CamScanner

දොරටුපාල සංකල්පය :- සන්නිවේදන ක්‍රියාව තුළ වාර්තා සියල්ල එලෙසින්ම වාර්තා කිරීමට ඉඩ නොදී පාලනය යම් පාර්ශවවල අවශ්‍යතා මත තෝරාගැනු: (අසම සම උසම තැන) ලෙස කිරීම දොරටු පාලක සංකල්පය ~~තුළ~~ හැඳින්වේ.

2015 A/L ජනමාධ්‍ය වාර්තාකරණය තුළ එබඳු වෙනස්කම් ඇතිවීම හඳුන්වන ප්‍රධාන සංකල්පය දොරටුපාල සංකල්පයයි.




www.artsapi.lk

Scanned by CamScanner

අසම සම උසම තැන



# සන්නිවේදන ආකෘති

❖ සන්නිවේදන ආකෘති මඟින් මානව සන්නිවේදන ක්‍රියාවලියේ සැබෑ තත්ත්වය හා එහි පවතින ගතික බව හඳුනාගත හැකිය.

## 01. ඇරිස්ටෝටල්ගේ ආකෘතිය

1 කථිකයා → 2 කතාව → 3 සවන් දෙන්නා → 4 බලපෑම

5 අවස්ථාව

- රේඛීය ආකෘතියකි.
- කරුණු 5ක් අවධාරණය කරයි.

1. The Speaker - කතාව පවත්වනු ලබන්නා
2. The Speech - පවත්වනු ලබන කතාව
3. The Audience - කතාවට සවන් දෙන්නන්
4. The Effect - කතාවේ බලපෑම
5. The Occasion - අදාළ අවස්ථාව

## 02. හැරල්ඩ් ඩිවයිට් ලැස්වෙල්ගේ සන්නිවේදන ආකෘතිය - 1948

| කවුද ? Who | → | කියන්නේ කුමක්ද ? Says what | → | කුමන නාලියකින්ද ? In which channel | → | කවුරුන් සඳහාද ? To whom | → | කවර බලපෑමක් සඳහාද? With what effect |
|---|---|---|---|---|---|---|---|---|
| සන්නිවේ-දකයා | | සන්දේශය | | මාධ්‍ය | | ග්‍රාහකයා | | බලපෑම |

www.artsapi.lk

Scanned by CamScanner

| ලැස්වෙල් ආකෘතිය | ඔස්ගුඩ් - ශ්‍රාම් ආකෘතිය |
|---|---|
| 1. රේඛීය වේ. | 1. චක්‍රාකාර වේ. |
| 2. ලැස්. ආකෘ. සන් කේන්ද්‍රීය වන අතර | 2. ඔස්ගුඩ් - ශ්‍රාම් ආකෘතිය සන්නිවේදක - ග්‍රාහක භූමිකා හුවමාරුව පැහැදිලි කරයි. |
| 3. ප්‍රතිපෝෂණය පිළිබඳ සැලකිලිමත් නොවන අතර | 3. ප්‍රතිපෝෂණය අත්‍යාවශ්‍ය අංගයක් ලෙස දක්වයි. |
| 4. බලපෑම පිළිබඳ දැඩි අවධානයක් යොමු කරයි. | 4. ඔස්ගුඩ් - ශ්‍රාම් ආකෘතිය එසේ නොවේ. |
| 5. සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර සිදුවන ක්‍රියාවලිය | ← එය ඔස්ගුඩ් - ශ්‍රාම් ආකෘතියෙහි වඩාත් හොඳින් විග්‍රහ කෙරේ |

2011 A/L 05 (i)

සන්නිවේ-දකයා | සන්දේශය | මාධ්‍ය | ග්‍රාහකයා

www.artsapi.lk

Scanned by CamScanner

• මූලිකාංගය ...
• ජෛවීය ආකෘතියකි.
• බලපෑම අවධාරණය කරයි.
• දේශපාලන විද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙ...
• ප්‍රතික්‍රියා දක්වා නොමැති වීම ... ඌණතාව...

2018 A/L (02) (i)

සන්නිවේදනය පිළිබඳ ගර්බනර්ගේ ආකෘතියෙහි අන්තර්ගත වඩාත් කැපී පෙනෙන සන්නිවේදන මූලිකාංගය කුමක් දැයි දක්වා එහි ප්‍රභේද දෙක නම් කරන්න

සන්නිවේදන මූලිකාංගය
සන්. බාධක හෙවත් ඝෝෂාව

එහි ප්‍රභේද 02
...න බාධක
... බාධක

www.alsapi.lk

... ආකෘතිය (...

Recie...
ග්‍රාහ...

20...


බාධක

...මික දෘෂ්...

...ධ බාධක

...නි.


04. ශ්‍රාම් - ඔස්ගුඩ් සන්නිවේදන ආකෘතිය (...




Scanned by CamScanner

- මූලිකාංග 5ක් ඔස්සේ විග්‍රහ කරයි.
- රේඛීය ආකෘතියකි.
- බලපෑම අවධාරණය කරයි.
- දේශපාලන විද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් ඉදිරිපත් කරයි.
- ප්‍රතික්‍රියා දක්වා නොමැති වීම දුර්වලතාවයකි.


## 03. ෂැනොන් හා වීවර් සන්නිවේදන ආකෘතිය (1949)




- තාක්ෂණික/යාන්ත්‍රික එනම් කාර්මික දෘෂ්ටිකෝණයෙන් ඉදිරිපත් කර තිබේ.
- රේඛීය ආකෘතියකි.
- සන්නිවේදන ක්‍රියාවලිය තුළ විවිධ බාධක පවතින බව දක්වයි.
- සම්ප්‍රේෂණය විග්‍රහ කර තිබේ.
- ගණිතමය ආකෘතියකි.

## 04. ශ්‍රාම් - ඔස්ගුඩ් සන්නිවේදන ආකෘතිය (1954)

2011 A/L (OS)




www.artsapi.lk

Scanned by CamScanner

• 2011: 05(ඇ) A/L

පරිච්ඡය සම්ප්‍රේෂණය කරන පාර්ශවය වෙත පෙරළා පරිච්ඡයක් ලැබෙ

(ඇ) එම ක්‍රියාවලිය නම් කර

* එම ක්‍රියාවලිය වන්නේ ප්‍රතිපෝෂණ ක්‍රියාවලියයි.

(02) (ආ) එහි ප්‍රයෝජන 02 ක් ලියන්න.

- සංදේශය ග්‍රාහකයා වෙත ලැබුණේ ද යන්න ස්ථිරව දැනගත හැකි වීම.
- සංදේශය ග්‍රාහකයා නිසි අයුරින් අවබෝධ කර ගත්තේ නැත්නම් නැවත සකස් කර ගැනීමට අවස්ථාව ලැබීම.
- සංදේශයේ අඩුපාඩු සකස් කර ප්‍රතිසංවිධානය කර ගැනීම.
- ග්‍රාහකයා හා සන්නි.කයා අතර අන්‍යෝන්‍ය සබඳතාවක් ඇති කර ගැනීම.
- පරිච්ඡය ප්‍රතිපෝෂණය කර ගැනීමට හැකි වීම.
- සංදේශයේ සාර්ථක අසාර්ථක බව දැන ගැනීමට

www.artsapi.lk

- මෙම ආකෘතිය ජීව විද්‍යාත්මක දෘෂ්ඨිකෝණයෙන් ඉදිරිපත්ව තිබේ.
- සන්නිවේදකයා හා ග්‍රාහකයා සම තත්වයෙහිලා සැලකේ.
- මාධ්‍ය ලෙස පංචේන්ද්‍රිය ආශ්‍රිත ක්‍රියා විග්‍රහ කරයි.
- ජෛවිය බව/ ප්‍රතික්‍රියා නොමැති වීම, බාධක නොදැක්වීම ඌණතා වේ.

Scanned by CamScanner

2011 A/L 05

1. **ආකේතකරය යනු** - සංදේශ සංඥා සංකේත බවට පත්කොට ඉදිරිපත් කරනු ලබන්නාය. (ආකේතකරණ ක්‍රියාවලියෙහි යෙදෙන්නාය.)

2. **විකේතකරය යනු** - ලැබෙන සංඥා, සංකේත නැවත සංදේශය බවට පරිවර්තනය කරනු ලබන්නාය. (විකේතකරණ ක්‍රියාවලියෙහි යෙදෙන්නාය.)

3. **ආකේතකරණය යනු** - සංදේශ සංඥා සංකේත බවට පත් කිරීමේ ක්‍රියාවලියයි

4. **විකේතකරණය යනු** - සංඥා සංකේත නැවත සංදේශ බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලියයි.

- මෙම ආකෘතිය මනෝවිද්‍යාත්මක දෘෂ්ටිකෝණයක් ගනී.
- රේඛීය නොවන, ප්‍රතිචාර / ප්‍රතිපෝෂණ සහිත චක්‍රාකාර ක්‍රියාවලියක් ලෙස සන්නිවේදනය විග්‍රහ කරයි.

## 05. ඩේවිඩ් කේ. බර්ලෝ ආකෘතිය - 1960

2010 A/L 06 (ii)

| S | M | C | R |
|---|---|---|---|
| Source and sender | Message | Channel | Receiver |
| මූලාශ්‍රය හා සන්නිවේදකයා | පණිවිඩය | නාලිකාව | ග්‍රාහකයා |
| සන්නිවේදන කුසලතා | මූලිකාංග | දැකීම (ඇස) | සන්නිවේදන කුසලතා |
| ආකල්ප | අන්තර්ගතය | ඇසීම (කන) | ආකල්ප |
| දැනුම | ව්‍යුහය | ආඝ්‍රාණය (නාසය) | දැනුම |
| සමාජ පද්ධතිය | කේත | ස්පර්ශය (සම) | සමාජ පද්ධතිය |
| සංස්කෘතිය | ඉදිරිපත් කිරීම | රස බැලීම (දිව) | සංස්කෘතිය |

- මෙම ආකෘතිය ජීව විද්‍යාත්මක දෘෂ්ඨිකෝණයෙන් ඉදිරිපත්ව තිබේ.
- සන්නිවේදකයා හා ග්‍රාහකයා සම තත්වයෙහිලා සැලකේ.
- මාධ්‍ය ලෙස පංචේන්ද්‍රිය ආශ්‍රිත ක්‍රියා විග්‍රහ කරයි.
- රේඛිය බව/ ප්‍රතික්‍රියා නොමැති වීම, බාධක නොදැක්වීම ඌණතා වේ.

www.artsapi.lk

Scanned by CamScanner

# සන්නිවේදන වර්ග

සන්නිවේදන වර්ග
- (01) අන්තර්වර්ති
- (02) අන්තර් පුද්ගල
- (03) සමූහ
- (04) ජනසන්නිවේදනය


## අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයේ ලක්ෂණ

- පුද්ගලයකු තුළම සිදුවන ආත්ම භාෂණයකි.
- සන්නිවේදකයා හා ග්‍රාහකයා, එකම පුද්ගලයෙකි.
- පුද්ගල මනසට සම්බන්ධ වේ.
- ස්වයං දෘෂ්ටිය / ස්වසංකල්පය අදාළ වේ.
- සංජානනයට අර්ථකතනයට උපකාර වේ.
- තීරණ ගැනීමේදී බුද්ධියට / දැනුමට සම්බන්ධ වේ.



## අන්තර් පුද්ගල සන්නිවේදනයේ ලක්ෂණ

- ද්වි පුද්ගල සහභාගිත්වය.
- ප්‍රතිපෝෂණය ක්ෂණික හා ප්‍රබල වීම.
- නිර්වාචික සන්නිවේදන උපක්‍රම බහුලව භාවිතය.
- බොහෝ විට අභිමුඛව සිදුවීම.
- සන්නිවේදක ග්‍රාහක භූමිකා නිරන්තරව හුවමාරු වීම.
- කාල,අවකාශ සීමා පැන නැඟීම අවම වීම.



www.artsapi.lk

Scanned by CamScanner

## සමූහ සන්නි. හා ජන සන් අතර මූලික වෙනස

2014 A/L

| සමූහ සන්නිවේදනය | ජන සන්නිවේදනය |
| --- | --- |
| 1. ග්‍රාහක සංඛ්‍යාව කුඩා හෝ විශාලය | 1. ග්‍රාහක සංඛ්‍යාව අති විශාලය |
| 2. යන්ත්‍ර භාවිතය අනිවාර්ය නොවේ. | 2. යන්ත්‍ර භාවිතය අනිවාර්ය වේ. |
| 3. වෘත්තීය මාධ්‍යවේදීන් නැත. | වෘත්තීය මාධ්‍යවේදීන් සිටී |
| 4. බහුවිධ දොරටු පාලකයින් නොමැත. | බහුවිධ දොරටු පාලකයින් සිටී. |
| 5. මූලික අයිතිකරුවෙක් නැත. | මූලික අයිතිකරුවන් වෙති |
| 6. සන්නිවේදක ග්‍රාහක සබඳතාව සෘජුව | සන්නිවේදක - ග්‍රාහක සබඳතාව දුරස් වේ. |
| සංවිධානාත්මක බවක් වැඩිය ද ආයතනගත බවක් නොමැත. | ආයතනගත සංවිධාන ව්‍යුහයකින් යුක්තවේ. |

www.artsapi.lk

2010 A/L

### වාචික සන්නිවේදනය

වාචික සන්නිවේදනය යනු කුමක් ද?

* කිසියම් භාෂාවක වචන උච්චාරණය කරමින් සන්නිවේදනයේ යෙදීම.

- නිරවුල් භාෂා උච්චාරණයක් තිබිය යුතුය.
- ක්ෂණික අවස්ථාද තිබෙන නමුත් පෙර සූදානම වැදගත්ය.
- වචන 7% / රිද්මය 38% / අවාචික සංඥා 55%/ලෙස දායක වෙයි.

(*) 2012 A/L

Scanned by CamScanner

2011 A/L

2010 A/L

## අවාචික සන්නිවේදනය

වචන භාවිතයෙන් තොරව වෙනත් විවිධ අවාචික උපක්‍රම භාවිත කරමින් සන්නිවේදනයේ යෙදීම.

අවාචික සන්නිවේදන ක්‍රම 4

- සංඥා | සංකේත | අභිනය | අවකාශය | පුද්ගල පෙනුම | අක්ෂි සම්බන්ධතාව | ගුණ හා ශබ්ද වල යොදාගනී.
- 1976 දී ගලි හා ලෙදර්ස් මෙම අවාචික සන්නිවේදනය අගය කරයි.

## දෘශ්‍ය සන්නිවේදනය

ඇස නැමති ඉන්ද්‍රිය මුල් වීමෙන් දැකීම මගින් සිදුවන සන්නිවේදනය.

- පැරණි ගුහා චිත්‍ර වල සිට රූපවාහිනිය දක්වා දියුණු වී ඇත.
- මිථ්‍යා විශ්වාස හා ජන ඇදහිලි සමඟ සම්බන්ධ වේ.

## ලිඛිත සන්නිවේදනය

කිසියම් සන්නිවේදන අරමුණක් ඉටුවන ආකාරයෙන් භාෂාවක් ක්‍රමවත්ව ලිවීම මගින් සන්නිවේදනයේ යෙදීම.

- ව්‍යාකරණ රීති, සම්ප්‍රදායන් ගරු කරයි.
- නිපුණතාව වෘත්තිය මට්ටමෙහිලා සැලකේ.
- යමක් ස්ථිරව හා නීත්‍යානුකූලව ප්‍රකාශ කල හැක.

## ශ්‍රව්‍ය සන්නිවේදනය

කණ හෙවත් ශ්‍රවණේන්ද්‍රිය මුල් වී ඇසීම මගින් සිදුවන සන්නිවේදනය

- හඬවල්, ශබ්ද, කටහඬ, සංගීතය, නිහඬතාව භාවිතා වේ.
- ආදීතම මානවයාත් වර්තමාන මානවයාත් භාවිත කරයි.

## විධිමත් සන්නිවේදනය

විධිමත් ධාරාවන් ඔස්සේ ක්‍රමානුකූලව ගලායන සන්නිවේදනයයි.

- නිශ්චිත පිළිවෙලකට තොරතුරු ගලා යයි.
- ජනමාධ්‍ය විධිමත්ය (ආයතනගතව සැලසුම් සහගතව සිදුවේ)
- විශ්වාසනීය තොරතුරු මූලාශ්‍ර තිබේ.
- ඉහළ සිට පහළට, පහළ සිට ඉහළට හා හරස් අතට සිදුවේ.

www.artsapi.lk

Scanned by CamScanner

(2016 A/L) 2012 A/L 06 (iii)


2014 2015

## අවිධිමත් සන්නිවේදනය

**අවිධිමත් ධාරාවන් ඔස්සේ අපිළිවෙලට ගලායන සන්නිවේදනය**

- මූලාශ්‍ර පැහැදිලි නොවීම.
- අවිධිමත් ධාරාවන් ඔස්සේ තොරතුරු ගලායාම.
- සැකය, කුතුහලය මත පදනම්ව ව්‍යාප්ත වීම.
- තොරතුරු වේගයෙන් ව්‍යාප්ත වීම.
- නිශ්චිත න්‍යාය පත්‍රයක් දැකිය නොහැක.
- නිල ස්වභාවයක් නොමැත.






P.P 57

www.artsapi.lk

Scanned by CamScanner

✱2014 A/L
✱2015 A/L වාර්තාගත

ජන මාධ්‍ය තුළ වාරණය ක්‍රියාත්මක වන ස්වරූප

සන්දේශ

1. තහනම් කිරීම.
2. ස්වයං වාරණය
3. අධ නියම කිරීම.
4. සන්දේශ පාලනය කිරීම
5. බලපත්‍ර නිකුත් කිරීම
6. බදු පැනවීම
7. නිසි බලධාරීන් පත් කිරීම
8. දඬුවම් කිරීම
9. හිංසා / ජීවිත හානි / තර්ජනය
10. ආධාර අනුග්‍රාහකත්වයෙන් පාලනය කිරීම.

P.P 57

අසම සම උසම තැන

✱2014 A/L / 2015 A/L

වෙළඳ දැන්වීම් සීමා කිරීම

නිසි බලධාරියෙක් පත් කිරීම

තහනම් කිරීම

කිරීම



ත්‍යාග හා සංග්‍රහ ලබාදීම

රීම.

ජනමාධ්‍ය තුළ වාරණය ක්‍රියාත්මක වන විධි

ත්‍ර ක්‍රමය

මාධ්‍යවේදීන්ට පහර දීම/ ජීවිත හානි කිරීම

මාධ්‍ය ආයතනවලට හානි කිරීම

2014 A/L

**විද්‍යුත් මාධ්‍ය**

- ශ්‍රව්‍ය, ශ්‍රව්
- වේගවත්ව
- සාක්ෂරත
- සජීවී ලෙ
- ක්ෂණිකව

2014 A/L

**මුද්‍රිත මාධ්‍යයේ**

- කියවා පෙ
- නිෂ්ක්‍රිය ම
- ක්ෂණික
- සංදේශව
- සාක්ෂරත
- තොරතුරු

edia

Mayura Bandara

## මුද්‍රිත මාධ්‍ය විශේෂතා

1. කියවා අවබෝධ කරගත යුතු මාධ්‍යයක් වීම.
2. කල්ගතව තොරතුරු ලබාගත නොහැකිය.
3. සංකීර්ණ අදහස් ඉදිරිපත් කළ හැකිය.
4. සාපේක්ෂ වශයෙන් නිෂ්ක්‍රීය මාධ්‍යයකි.
5. සංදේශවලට ස්ථිර බවක් ලැබේ.
6. සාක්ෂරතාව අත්‍යාවශ්‍ය වේ.
7. එකම පණිවිඩයෙ විවිධ ගණනාවක් ලබාගත හැක.
8. අභිමතය පරිදි භාවිත කළ හැකිය.

## විද්‍යුත් මාධ්‍ය විශේෂතා

1. ශ්‍රව්‍ය, ශ්‍රව්‍ය / දෘශ්‍ය විය හැකිය.
2. සාක්ෂරතාව අත්‍යාවශ්‍ය නොවේ.
3. වේගවත් ව පණිවිඩ ව්‍යාප්ත කළ හැකිය.
4. සජීවී ලෙස භාවිත කළ හැකිය.
5. කල්ගතව තොරතුරු සම්පාදනය කළ හැකිය.
6. සංකීර්ණ අදහස් ඉදිරිපත් කළ නොහැකිය.

2014

www.artsapi.lk

Scanned by CamScanner

අසම යම උසම තැන

(*) 2014 A/L / 2015 A/L

## ජනමාධ්‍ය තුළ වාරණය ක්‍රියාත්මක වන විධි




- වෙළඳ දැන්වීම් සීමා කිරීම
- නිසි බලධාරියෙක් පත් කිරීම
- දඩ නියම කිරීම
- තහනම් කිරීම
- දඬුවම් කිරීම.
- ත්‍යාග හා සංග්‍රහ ලබාදීම
- බලපත්‍ර ක්‍රමය
- මාධ්‍යවේදීන්ට පහර දීම/ ජීවිත හානි කිරීම
- මාධ්‍ය ආයතනවලට හානි කිරීම

2014 A/L


## විද්‍යුත් මාධ්‍යයේ ලක්ෂණ

- ශ්‍රව්‍ය, ශ්‍රව්‍යදෘශ්‍ය විය හැකිය.
- වේගවත්ව පණිවිඩයක් ව්‍යාප්ත කළ හැකිය.
- සාක්ෂරතාවය අවශ්‍ය නොවේ.
- සජීවී ලෙස භාවිතා කළ හැකිය.
- ක්ෂණිකව තොරතුරු සම්පාදනය කළ හැකිය.




2014 A/L

## මුද්‍රිත මාධ්‍යයේ ලක්ෂණ



- කියවා තේරුම්ගත යුතු මාධ්‍යකි.
- නිෂ්ක්‍රිය මාධ්‍යයකි . (උදාසීන)
- ක්ෂණික තොරතුරු ලබාදිය නොහැකිය.
- සංදේශවලට ස්ථාවර බවක් ලැබේ.
- සාක්ෂරතාවය අවශ්‍යවේ.
- තොරතුරු විස්තරාත්මකව හා විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කළ හැකිය.

www.artsapi.lk

Scanned by CamScanner